**වවුනියා උතුර ප්‍රාදේශීය සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තයව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**--------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

සභාව සතු නලලිං 130 ක සහ විපී පහන් 225 ක වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබීමෙන් වත්කම්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.3 නොසැසඳුණු ගිණුම්
**-----------------------**

සමාලෝචිත වර්ෂයේ ආදායම් ලේඛනය අනුව වර්ග 05 ක ආදායම් සාරාංශවල 05 ක එකතුව රු. 24,568,061 ක් නිරීක්ෂණය වූ අතර, එය මූල්‍ය ප්‍රකාශන වල රු. 24,668,061 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 100,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 අනුකූල නොවීම**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| --------------------------------------- | ------------ | ------------------ |
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| රීති 153 | - | සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ප්‍රකාශය ප්‍ර.ස - 7 ආකෘතියේ පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 571 | 1,150,532 | (i) කල් ඉකුත්වූ තැන්පත් දෙකක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.<br>(ii) විස්තර ඉදිරිපත් නොවූ රු. 11,522 ක තැන්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | - | වාහනවල ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊලග මාසයේ 15 වන දිනව ප්‍රථම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂණ පසුගිය වර්ෂ එකකට වැඩි කාලයක් සිදුකර නොතිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 14,529,883 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 7,201,813 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන් තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන් තු ගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 4,270,000 | | 5,241,500 | 1,073,894 | 3,517,000 | | 5,391,955 | 307,555 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 725,000 | | 3,397,655 | - | 414,000 | | 843,344 | - |
| (iii) | වෙනත් ආදායම් | 3,113,000 | | 5,004,445 | 13,673,356 | 5,741,400 | | 8,558,603 | 1,149,101 |

**2.2.2 බලපත්‍ර ගාස්තු**

සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ස්ථාන 210 කට වෙළඳ බලපත්‍ර ලබා නොදීමෙන් වෙළඳ බලපත්‍ර ගාස්තු නිසි පරිදි අයකර ගැනීමට සභාවට නොහැකිවී තිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 94,910 ක් හා මුද්දර ගාස්තු රු. 1,518,374 ක් විය.

**2.2.4 අවිධිමත් ගණුදෙනු**

සමාලෝචිත වර්ෂයේදී සභාවේ නිලධාරින්ගේ වැටුප් සකස් කිරීමේදි නිවැරදිව ගණනය කර නොතිබීමෙන් සේවක අර්ධසාධක අරමුදලට රු. 17,266 ක දඩ මුදල් වගකියයුතු අයගෙන් අය නොකර සභා අරමුදලින් ගෙවා තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**3.1 කාර්‍ය සාධනය**

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසල බැහැර කරන ස්ථානයන් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ii) සෞඛ්‍ය කම්කරුවන් සඳහා වාර්ෂික වෛද්‍ය පරීක්ෂවලට භාජනයකර නොතිබුණි.

(ii) අපද්‍රව්‍ය වර්ගීකරනය කර ලබා ගෙන නොතිබුණි.

(iii) සභාවේ කසල බැහැර කරන ස්ථානවලට ලැබෙන කසල වර්ගීකරණය කිරීමට වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි.

(iv) අපද්‍රව්‍ය කළමනා කරණ පිළබඳ නිලධාරින්ට පුහුණු ලබාදී නොතිබුණි.

(v) අපද්‍රව්‍ය කළමනාකරණ අවශ්‍ය තොරතුරු සහ දත්ත ක්‍රමයක් පවත්වා නොතිබුණි.

(vi) සණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරනයෙන් තොරව පරිසරය දූෂණය වන ආකාරයට ගිණි තබා පුළුස්සනු ලැබේ.

(vii) සභා අරමුදලින් කසල කළමනාකරණ සඳහා වැයවන මුදල් ප්‍රමාණය රැස්කර ගැනීම සඳහා කසල බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) සභා බලප්‍රදේශයේ තිබෙන කඩ සහ නිවස්වලින් ලබා ගන්නා කසල වර්ගීකරනය කර මළුවලට දමා ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

---------------------------------

ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වශයෙන් හඳුනාගෙන තිබු තොග භාණ්ඩ 109 ක් සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දින හා අංක 438 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

සභාවේ බලප්‍රදේශයේ තිබෙන දේපල සම්බන්ධයෙන් සභාව විසින් වරිපනම්බදු සඳහා නැවත තක්සේරු කර වරිපනම් බදු අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

අයවැය ගත ආදායම සහ තත්‍ය ආදායම අතර අහිතකර රු. 10,596,278 සිට හිතකර රු. 3,433,362 ක් දක්වා නොහොත් එය සීයට 31.23 සිට සීයට 77.13 දක්වා විචලනයක්ද ඇස්තමේන්තු ගත වියදම් සහ තත්‍ය වියදම් අතර අහිතකර රු. 12,220 සිට හිතකර රු. 10,571,356 ක් දක්වා නොහොත් සීයට 56.87 සිට සීයට 16.42 දක්වා විචලනයන් නිරීක්ෂණය විය.

**4.2** **අභ්‍යන්තර විගණනය**

**------------------------**

සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, අභ්‍යන්තර විගණනයෙන් ඵලදායි ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේදී විගණනයට ලැබී නොතිබුණි.

**5** **පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| **පද්ධතිය** | | **අඩුපාඩු** |
|---|---|---|
| ගිණුම්කරණය | (i) | ගිණුම්පොත් හා ලේඛන යාවත්කාලින කර නොතිබුණි. |
| | (ii) | පොදු ලෙජරය තුලනය කර නොතිබුණි. |